# ආඩම්බර කුරුළු පැංචි



අදිති බිනුල්යා වික්‍රමසිංහ

# ආඩම්බර කුරුළු පැංචි

කතෘ

අදිති බිනුල්යා වික්‍රමසිංහ

**2 ශ්‍රේණිය D**

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

**2023.11.15**

# පිදුම

ආදරෙන් අකුරු කියා දෙමින්,

හොඳ නරක කියා දෙමින් අප රැකගත්

මාගේ ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මැණියන්ට

ආදරයෙන් පුදමි.

## ස්තූතිය!

මේ පොත ලිවීමට අවස්ථාව ලබාදුන්, අපව උනන්දු කළ
මහමායා බාලිකා විද්‍යාලයේ විද්‍යාලපතිනිය
ශෂිකලා සේනාධීර ගුරු මෑණියන්ටත්,
අප පන්තිභාර ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්,
පොත ලියන්නට මට උදව් කළ මගේ අම්මාටත්
ගොඩක් ස්තුතියි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න  දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයේ මෙන්ම කාලීන ජාතික අශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුල ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023 10. 20**

# ආඩම්බර කුරුළු පැංචි

එකමත් එක කැලෑ ගමක කුරුළු පැංචියෙක් හිටියා. එයාගේ අම්මයි තාත්තයි ඒ කුරුළු පැංචිට ගොඩක් ආදරේ කළා.



අම්මයි තාත්තයි ආදරේට එයාව හුරතල් කරනකොට නිතරම කියන්නේ, “ ඔයා තමයි මේ ලෝකේ ඉන්න ලස්සනම කුරුළු පැංචි” කියලා.

කුරුළු පැංචි ගොඩක් ආඩම්බරෙන් තමයි හිටියේ. එයාගේ කුරුළු යාළුවන් අතරෙත් එයා ගොඩක් ආඩම්බරෙන් තමයි හිටියේ. එයා ඒ අයව වැඩිය ගනන් ගත්තෙත් නෑ. අනෙක් කුරුළු පැටව් එක්ක වැඩිය සෙල්ලම් කරන්න ගියෙත් නෑ.



එයා නිතරම හිතුවේ එයා තමයි මේ ලෝකෙ ඉන්න ලස්සනම කුරුළු පැංචි කියලා.

එක දවසක් එයා අහසේ පියාඹ පියාඹ ඉද්දී අනෙක් කුරුළු යාළුවොත් සෙල්ලම් කරමින් අහසේ පියෑඹුවා. කුරුළු පැංචි එයාලා එනවට කැමති වුණේ නෑ. ඒ අය කැතයි කියලා විහිළු කළා.



ඒ කුරුළු පැටවුන්ට ගොඩක් දුක හිතුණා. කුරුළු පැංචි පියාඹලා ඉක්මනට ගෙදර ගියා.

කුරුළු පැංචිගේ අම්මා පුදුම වුණා. කුරුළු පැංචි සෙල්ලම් කරලා අද කලින්ම ගෙදර ඇවිල්ලා!

“ පුතේ ඇයි ඔයා අද කලින්ම ගෙදර ඇවිත්?”කුරුළු පැංචිගේ අම්මා ඇහුවා.



“මට බෑ අනිත් අය එක්ක සෙල්ලම් කරන්න. එයාලා හරිම කැතයි මම කැමති නෑ.” කුරුළු පැංචි කිවුවා.

“අපි හැමෝම එකමුතුව සතුටින් සමගියෙන් ඉන්න ඕනේ. අපි කාටවත් දුක හිතෙන විදියට වැඩ කරන්න හොඳ නෑ.” කුරුළු පැංචිගේ හිස අතගාමින් අම්මා ආදරයෙන් කිව්වා.



කුරුළු පැංචි අම්මා කියපු දේවල් ගනන් ගත්තේ නෑ.

තවත් දවසක කුරුළු පැංචි අහසේ පියාඹ පියාඹ ඉද්දි එයා දැක්කා ලස්සන ලස්සන කුරුල්ලෝ, සමනල්ලු අහසේ පියාඹමින් සෙල්ලම් කරමින් ඉන්නවා. කුරුළු පැංචිට ආස හිතුණා එයාලා එක්ක යාළු වෙන්න, සෙල්ලම් කරන්න. හැබැයි එයාලා කුරුළු පැංචිව ගනන් ගන්නෙ නැතුව යන්න ගියා.



කුරුළු පැංචි ට ගොඩක් දුක හිතුණා.

ඒ වෙලාවේ කුරුළු  පැංචිට මතක් වුණා, එයත් මේ විදිහට නේද එයාගේ යාළුවන්ගේ හිත රිද්දුවේ කියලා. කුරුළු පැංචිට ඒ ගැන  ගොඩක්  දුක හිතුණා.



 කුරුළු   පැංචි ඉක්මනටම එයාගෙ යාළුවන් හොයාගෙන ගියා.

කුරුළු පැංචි යාළුවන්ගෙන් සමාව ඉල්ලුවා. යාළුවෝ හැමෝම ගොඩක් සතුටින් කුරුලු පැංචි ව පිළිගත්තා. එදා ඉඳලා එයාලා හොඳම යාළුවො වුණා.



යාළුවනේ අපි කවදාවත් කිසිම දෙයක් නිසා ආඩම්බර වෙන්න හොඳ නෑ. කිසිම කෙනෙකුගේ හිත රිද්දන්න හොඳ නෑ.

-නිමි

# පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදු වන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කිරීම කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක් ව මෙවර ජාත්‍යන්තර පාඨකයින් වෙත ළඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග �මැද සංකල්ප මංකොල්ලයන්ට හසු වෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20





ISBN 978-624-206-780-3